සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2019

11 ශ්‍රේණිය **ව්‍යවසායකත්ව අධ්‍යයනය - I** කාලය පැය 01 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. පහත දැක්වෙන ප්‍රකාශ අතරින් ව්‍යවසායකත්වය වඩාත් හොඳින් විස්තර වන ප්‍රකාශ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

A - දැනුම හා සම්බන්ධ වූවකි
B - පුද්ගලයෙකුගේ පෞරුෂ ගුණාංගයකි
C - පුද්ගලයෙකු හා බැඳුන මනෝභාවයකි
D - වෙනසක් ඇති කිරීමට පදනම් වූ චින්තනයකි

(1) A හා D (2) B හා C (3) A හා B (4) C හා D

02. ප්‍රසිද්ධ ව්‍යවසායකයෙකු වූ සුනිමල් වාර්ෂික ව්‍යවසායකත්ව සමුළුව අමතා ප්‍රකාශ කලේ "මට මගේ ව්‍යාපාරය පිළිබඳව හැමදාම දකින සිහිනයක් තිබුණා" යනුවෙනි. මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ,

(1) ප්‍රතිපත්ති ගරුක බවයි
(2) අවදානම් සහගත බවයි
(3) දැක්මක් සහිත බවයි
(4) අවිනිශ්චිතතාවයක් ඇති බවයි

03. පුද්ගලයන් ඒකාකාරී බවින් මිදී විවිධ ආකාරයට සිතීමට හා දැකීමට කටයුතු කිරීම තුළින්,

(1) ප්‍රායෝගිකත්වය වර්ධන කළ හැකි වේ.
(2) සමාජ වගකීම් ඉටුකළ හැකි වේ.
(3) අවදානමට පෙර සූදානම් විය හැකිවේ.
(4) නිර්මාණශීලීත්වය වර්ධනය කර ගත හැකි වේ.

04. ටිකිරි උදෑසනින් අවදි වී පාසලේ නිළ ඇඳුමින් සැරසුනාය. සුපුරුදු ලෙස උදෑසන ආහාරය ලෙස බත් ආහාරයට ගැනීමෙන් පසු පාසල් වෑන් රථයෙන් පාසලට ගියාය. මෙම සිද්ධියෙහි වුවමනා සංඛ්‍යාව,

(1) 02 කි (2) 03 කි (3) 04 කි (4) 05 කි

05. ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර පවතින සමානකමක් ලෙස සැලකිය හැක්කේ,

(1) දැක්මක් සහිත වීම
(2) නව්‍යතා සම්පාදනය කිරීම
(3) ගතානුගතිකව ගැටළු විසඳීම
(4) අවදානමකට මුහුණ දීම

06. නගරයේ ප්‍රසිද්ධ පාසලක් අසල පොත් සාප්පුවක් පවත්වාගෙන යන ගුණසිරි මහතා සෑම වර්ෂයකම තමා උපයන ලාභයෙන් කොටසක් පාසලේ යම් සංවර්ධන කටයුත්තක් සඳහා ලබාදෙයි. මේ අනුව ගුණසිරි මහතා හැඳින්විය හැක්කේ,

(1) සමාජීය ව්‍යවසායකයෙකු ලෙස ය.
(2) ව්‍යාපාර ව්‍යවසායකයෙකු ලෙස ය.
(3) අභ්‍යන්තර ව්‍යවසායකයෙකු ලෙස ය.
(4) ආයතනික ව්‍යවසායකයෙකු ලෙස ය.

07. සිරිල්ගේ ව්‍යාපාරය පිළිබඳව තොරතුරු කීපයක් පහත දැක්වේ.

A - දක්ෂ කළමණාකරුවන් සිටීම
B - සිරිල් සතුව ඉහළ මූල්‍ය ශක්තියක් පැවතීම
C - විශාල පාරිභෝගික සංඛ්‍යාවක් සිටීම
D - තරගකරුවන් බහුලව සිටීම

මේ අතුරින් සිරිමල්ගේ ව්‍යාපාරයේ ශක්තීන් ලෙස සැලකිය හැක්කේ,

(1) A හා C (2) A හා B (3) B හා C (4) B හා D

08. රජය විසින් බදු අනුපාතය ඉහළ නැංවීම,

(1) ප්‍රජා පරිසර සාධකයකි .
(2) ආර්ථික පරිසර සාධකයකි.
(3) දේශපාලන හා නෛතික පරිසර සාධකයකි.
(4) සමාජ හා සංස්කෘතික පරිසර සාධකයකි.

09. කුඩා පරිමාණ ව්‍යාපාරයක ලක්ෂණයක් ලෙස හඳුනාගත හැක්කේ,

(1) ව්‍යාපාරය තනි අයිතිකරුවෙකු සතුවීම (2) ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්තවීම
(3) වගකීම සීමා සහිත වීම (4) විදේශ වෙළඳ කටයුතු සිදු නොකිරීම

10. වෙළඳපොළ සීමාවීම කුඩා ව්‍යාපාර සතු,

(1) ශක්තියකි (2) සීමාවකි (3) අවස්ථාවකි (4) තර්ජනයකි

11. වෙළඳපොළ අවස්ථා හඳුනාගෙන නව නිපැයුම් බිහි කිරීම සඳහා ව්‍යවසායකයෙකුට අවශ්‍ය වන්නේ,

(1) උපදේශන කුසලතාවයයි (2) තාක්ෂණික කුසලතාවයයි
(3) සංකල්පනාත්මක කුසලතාවයයි (4) සන්නිවේදන කුසලතාවයයි

12. මැණික් කර්මාන්තය ඇතුළත් වන ව්‍යාපාර අංශය වන්නේ,

(1) ප්‍රාථමික අංශයයි (2) ද්විතියික අංශයයි (3) තෘතියික අංශයයි (4) කාර්මික අංශයයි

13. නව ව්‍යවසායකයෙකුට ප්‍රාග්ධනය සම්පාදනය කරගත හැකි ආකාරයක් **<u>නොවන්නේ,</u>**

(1) ස්වකීය ඉතුරුම් (2) බැංකු ණය (3) බැංකු අයිරා (4) වත්කම් විකිණීම

14. දැනට පවත්නා භාණ්ඩයකට නව උපාංග එකතු කිරීම SCAMPER අකෘතියට අනුව හැඳින්වෙන්නේ,

(1) ආදේශ කිරීම ලෙසයි (2) කුඩා කිරීම ලෙසයි
(3) සම්බන්ධ කිරීම ලෙසයි (4) යලි සකස් කිරීම ලෙසයි

15. තම ව්‍යාපාරයේ නිෂ්පාදිත වෙනත් තරඟකරුවන්ගෙන් වෙනස් කිරීමට ගන්නා උත්සාහයක් ලෙස නිෂ්පාදිත ප්‍රභේදනය හැඳින්විය හැක. ව්‍යවසායකයන් මෙය යොදා ගන්නේ,

(1) නව ව්‍යාපාරයක් සඳහා පිවිසුම් උපායමාර්ගයක් ලෙසය
(2) නිර්මාණශීලීත්වය වර්ධනය කිරීමේ ක්‍රමවේදයක් ලෙසය
(3) වෙළඳපොලට පිවිසිය හැකි විකල්ප ක්‍රමවේදයක් ලෙසය
(4) ඉලක්ක වෙළඳපොළ හඳුනා ගැනීමේ ක්‍රම වේදයක් ලෙසය

16. අවදානම භාර ගන්නා පුද්ගලයාට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් අත්පත් කර දීමේ හැකියාව ඇති ආකර්ශනීය ආයෝජන අදහසක්,

(1) ව්‍යාපාර අදහසකි (2) ව්‍යාපාර අවස්ථාවකි (3) ව්‍යාපාර අරමුණකි (4) ව්‍යාපාර දැක්මකි

17. යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීමේ ක්‍රියාවලිය අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න

(1) සාර්ව විශ්ලේෂණය, සූක්ෂම විශ්ලේෂණය, ශඳුඅත විශ්ලේෂණය
(2) ශඳුඅත විශ්ලේෂණය, සූක්ෂම විශ්ලේෂණය, සාර්ව විශ්ලේෂණය
(3) සූක්ෂම විශ්ලේෂණය, සාර්ව විශ්ලේෂණය, ශඳුඅත විශ්ලේෂණය
(4) සාර්ව විශ්ලේෂණය, ශඳුඅත විශ්ලේෂණය, සූක්ෂම විශ්ලේෂණය

18. පහත දැක්වෙන්නේ සැළසුම් පිළිබඳ ප්‍රකාශ කීපයකි.

A - සැලසුමක් සාර්ථක හෝ අසාර්ථක වීමේ ඉඩකඩ පවතී
B - සැලසුම් සකස් කිරීමේ දී පරිසර සාධක පිළිබඳව අවදානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.
ඉහත ප්‍රකාශ අතරින්,

(1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ (2) A හා B අසත්‍ය වේ
(3) A අසත්‍ය වන අතර B සත්‍ය වේ (4) A හා B සත්‍ය වේ

19. පහත A හා B නිවැරදිව ගළපන්න.

| A | B |
|---|---|
| a. විධායක සාරාංශය | 1. ප්‍රාග්ධන අවශ්‍යතාව |
| b. අලෙවි සැලැස්ම | 2. ඒකකයක නිෂ්පාදන පිරිවැය |
| c. නිෂ්පාදන සැලැස්ම | 3. ව්‍යාපාරයේ සුවිශේෂතාවය |
| d. මූල්‍ය සැලැස්ම | 4. ඇස්තමේන්තු ගත ප්‍රචාරක වියදම් |

(1) a - 2, b-3, C - 2, d - 1 (2) a - 3, b - 4, c - 2, d -1
(3) a - 4, b - 2, c - 1, d - 3 (4) a - 3, b - 4, c - 1, d - 2

20. අලෙවි සැලැස්මක් සකස් කිරීමේ ක්‍රියාවලියේ පළමු පියවර ලෙස සැලකිය හැක්කේ,

(1) විකුණුම් පුරෝකථනයයි (2) අලෙවිකරණ උපායමාර්ග තීරණය කිරීමයි
(3) වෙළඳපොළ විශ්ලේෂණයයි (4) අලෙවි ආදායම හා වියදම පුරෝකථනය කිරීමයි

21. ව්‍යවසායකයෙකු විසින් ඉදිරිපත් කරන භාණ්ඩය හෝ සේවයට සමාන භාණ්ඩ හා සේවා වෙළඳපොළට සපයන්නේ,

(1) තරඟකරුවන් වේ (2) විභව ආයෝජකයන් වේ
(3) සැපයුම්කරුවන් වේ (4) ඉලක්ක කණ්ඩායම් වේ

22. ඉලක්ක පාරිභෝගිකයන් ආකර්ශනය කර ගැනීම සඳහා භාවිතා කරන උපක්‍රම හැඳින්වෙන්නේ,

(1) අලෙවි පුරෝකථනය ලෙස ය. (2) වෙළඳපොළ විශ්ලේෂණය ලෙස ය.
(3) අලෙවි ප්‍රවර්ධනය ලෙස ය. (4) විකුණුම් පුරෝකථනය ලෙස ය.

23. නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීමේ මූලික අරමුණක් ලෙස හඳුනාගත හැක්කේ,

(1) පරිවර්තන ක්‍රියාවලිය හඳුනා ගැනීම
(2) නිෂ්පාදන ඒකක සංඛ්‍යාව තීරණය කිරීම
(3) නිෂ්පාදන ස්ථාවර වත්කම් අගය කිරීම
(4) මුළු නිෂ්පාදන පිරිවැය හා ඒකක පිරිවැය ගණනය කිරිම

24.

$$\text{ඒකකයක නිෂ්පාදන පිරිවැය} = \frac{\dots\dots\dots\dots}{\text{නිෂ්පාදන ඒකක සංඛ්‍යාව}}$$

හිස්තැනට ගැළපෙන පිළිතුර වන්නේ,

(1) මුළු ද්‍රව්‍ය පිරිවැය (2) මුළු නිෂ්පාදන පිරිවැය
(3) මුළු ස්ථාවර පිරිවැය (4) මුළු ශ්‍රම පිරිවැය

25. පහත දැක්වෙන වියදම් අතරින් පරිපාලන වියදමක් ලෙස සැලකිය හැක්කේ,

(1) ණය පොලී (2) නිෂ්පාදන ස්ථාවර වත්කම්
(3) ගොඩනැගිලි කුළී (4) අමුද්‍රව්‍ය වියදම්

26. පහත දැක්වෙන වියදම් අතරින් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර දැරීමට සිදුවන වියදමක් ලෙස සැලකිය හැක්කේ,

(1) පරිගණක යන්ත්‍රයක් මිලට ගැනීමේ වියදම (2) කළමණාකරුවන්ගේ වැටුප් ගෙවීමේ වියදම
(3) මෝටර් රථය 10% ක්ෂය කිරීමේ වියදම (4) ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමේ වියදම

- **පහත දී ඇති තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 27, 28, 29 යන ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා දෙන්න.**

"කමලසිරි" ව්‍යාපාරයේ ව්‍යාපාර සැලැස්මේ අඩංගු තොරතුරු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| විකුණුම් ආදායම | 500 000 |
| අමුද්‍රව්‍ය පිරිවැය | 150 000 |
| ශ්‍රම පිරිවැය | 50 000 |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 25 000 |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | 10 000 |
| පරිපාලන වියදම් | 15 000 |

27. කමලසිරිගේ ව්‍යාපාරයේ මුළු නිෂ්පාදන පිරිවැය වන්නේ,

(1) රු. 225 000 (2) රු. 235 000 (3) රු. 250 000 (4) රු. 500 000

28. මුළු නිෂ්පාදන **නොවන** පිරිවැය වන්නේ,

(1) රු. 10 000 (2) රු. 25 000 (3) රු. 35 000 (4) රු. 50 000

29. ව්‍යාපාරයේ ශුද්ධ ලාභය වන්නේ,

(1) රු. 100 000 (2) රු. 150 000 (3) රු. 200 000 (4) රු. 250 000

30. කමලසිරිගේ ව්‍යාපාරයේ මුදල් ගලා ඒම් ලෙස සැලකිය හැක්කේ,

(1) රු. 300 000 (2) රු. 500 000 (3) රු. 600 000 (4) රු. 750 000

31. ව්‍යාපාරයක මුදල් ගලා ඒම් හා මුදල් ගලා යාම් සම්බන්ධ තොරතුරු ඇතුළත් කර සකස් කරන ලේඛණය වන්නේ,

(1) ආදායම් ප්‍රකාශනය (2) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(3) මුළු ආයෝජන ඇස්තමේන්තුව (4) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

32. ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී ආයතනයක් ලෙස කටයුතු කරන රතු කුරුස සංවිධානය අයත් වන ව්‍යාපාර වර්ගය වන්නේ,

(1) ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර (2) පෞද්ගලික අංශයේ ව්‍යාපාර

(3) රාජ්‍ය අංශයේ ව්‍යාපාර (4) ලාභ අරමුණු කරගත් ව්‍යාපාර

33. කේවලස්වාමි ව්‍යාපාරවල සීමාවක් ලෙස හඳුනාගත හැක්කේ,

(1) ව්‍යාපාරයට බලපාන නිති අඩුවීම (2) ස්වාධීන තීරණ ගත හැකි වීම

(3) අයිතිකරුගේ වගකීම අසීමිත වීම (4) සියලුම ලාභ අයිතිකරු සතු වීම

34. සමාගම් පනතට අනුව ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කළහැකි මූලික සමාගම් වර්ග තුන වන්නේ,

(1) සීමාසහිත සමාගම් / අක්වෙරළ සමාගම් / ඇපයෙන් සීමිත සමාගම්

(2) සීමා සහිත සමාගම් / සීමා රහිත සමාගම් / ඇපයෙන් සීමිත සමාගම්

(3) සීමා සහිත පොදු සමාගම් / සීමා සහිත පෞද්ගලික සමාගම් / අක්වෙරළ සමාගම්

(4) සීමා සහිත සමාගම් / සීමා රහිත සමාගම් / අක්වෙරළ සමාගම්

35. හවුල් ව්‍යාපාර ලියාපදිංචිය සම්බන්ධයෙන් බලපාන නීතිය වන්නේ,

(1) 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම පනත (2) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත

(3) 2007 අංක 07 දරණ සමාගම් පනත (4) 1840 වංචා වැලැක්වීමේ ආඥා පනත

36. වරලත් හිමියෙකු තම වෙළඳ නාමය භාවිතයට වරලත් ලාභියාට අවසර ලබාදිම වෙනුවෙන් අයකරන ගාස්තුව හැඳින්වෙන්නේ,

(1) ලාභාංශය ලෙස ය (2) ණය පොළිය ලෙස ය (3) පුරස්කාරය ලෙස ය (4) කීර්තිනාමය ලෙස ය

37. රජයවිසින් ව්‍යාපාර සංවර්ධනය සඳහා ලබාදෙන මූල්‍යමය දිරිගැන්වීමක් වන්නේ,

(1) තාක්ෂණික දැනුම ලබාදීම (2) බදු සහන ලබාදීම

(3) ප්‍රදර්ශන හා වැඩමුළු පැවැත්වීම (4) දේශීය හා විදේශීය ගැනුම් කරුවන් මුණ ගැස්වීම

38. අවශ්‍ය වේ යැයි අපේක්ෂා කරන මානව සම්පත් පිළිබඳ තොරතුරු හා පිරිවැය ඇස්තමේන්තු ඇතුළත් කොට සැකසෙනුයේ,

(1) නිෂ්පාදන සැලැස්මයි (2) පරිපාලන සැලැස්මයි

(3) සංවිධාන ව්‍යුහයයි (4) පරිපාලන ව්‍යුහයයි

39. හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් අතර එකඟතාව පවත්වා ගන්නේ,

(1) සංස්ථාපන සහතිකය මගිනි (2) ලියාපදිංචි සහතිකය මගිනි

(3) හවුල් ව්‍යාපාර ආඥා පනත මගිනි (4) හවුල් ගිවිසුම මගිනි

40. ව්‍යවසායකයන් සංවර්ධනය කිරීම මුල් කර ගනිමින් ආරම්භ කළ බලපත්‍රලාභී විශේෂිත බැංකුව වනුයේ,

(1) SMED බැංකුව (2) ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

(3) මහජන බැංකුව (4) DFCC බැංකුව

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

11 ශ්‍රේණිය **ව්‍යවසායකත්ව අධ්‍යයනය - II** කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ව්‍යාපාරයක් කිරීම පිළිබඳව සිහින දකිමින් සිටි සුදෙස් මහතා ඔහුගේ සිහිනය සැබෑ කර ගැනීම සඳහා රිදීගම කරදගොල්ල ප්‍රදේශයේ වෙළඳපොළ සමීක්ෂණයක නිරත විය. එහි දී මෙම ප්‍රදේශයේ ජීවත් වන ජනගහනය 6000 ක් පමණ වන බවත්, ඔවුන්ගෙන් 40% ක් පමණ දෛනිකව යෝගට් පාරිභෝජනය කරන බවත්, දැනටමත් මෙම යෝගට් අවශ්‍යතාවය ප්‍රනීත, රසික සහ සීකෝ යන ආයතන විසින් පිළිවෙලින් 50% ක් 30% ක් සහ 20% ක් වශයෙන් සපයන බවත් අනාවරණය කර ගෙන ඇත.

පාරිභෝගික අදහස් වලට අනුව ශරීරයේ අනවශ්‍ය මේද (කොලෙස්ටරෝල්) ඉවත් කළ හැකි ඖෂධීය යෝගට් වර්ගයක් හඳුන්වා දීමටත් "සුදෙස් ඖෂධීය යෝගට්" නමින් ව්‍යාපාරය ආරම්භ කර පවත්වාගෙන යාමටත් අදහස් කරයි.

පළමු වර්ෂය තුළ දී මෙම ප්‍රදේශයේ යෝගට් වෙළඳපලින් 10% ක ප්‍රමාණයක් අත්පත් කර ගැනීමටත් යෝගට් සෑදීමට අවශ්‍ය කිරි කරදගොල්ල ප්‍රදේශයේ සිටින කිරි ගොවීන්ගෙන් ම ලබා ගැනීමටත්, රුපියල් 15 ක පිරිවැයක් දරා, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් අනුමත කරන ලද ප්‍රමිතියට අනුව සෞඛ්‍යාරක්ෂිතව නිපදවීමටත්, යෝගට් එකක් රුපියල් 30 ක මිලකට සිල්ලර වෙළඳුන් හරහා බෙදා හැරීමටත්, පාරිභෝගිකයින් දැනුවත් කිරීම සඳහා යෝගට් අලෙවිකරණ සිල්ලර වෙළඳසැල් අසල පෝස්ටර් ප්‍රදර්ශනය කිරීමටත් අදහස් කරයි.

i. සුදෙස් මහතා වෙළඳපළට ප්‍රවේශ වන ක්‍රමය සඳහන් කරන්න.
ii. යෝගට් නිෂ්පාදන ව්‍යාපාරය අයත් වන ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශය සඳහන් කරන්න.
iii. සුදෙස්ගේ ව්‍යාපාරයේ පවතින හොඳ ව්‍යාපාර අවස්ථාවක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.
iv. සුදෙස්ගේ ව්‍යාපාරය මගින් මිනිසුන්ගේ කවර අවශ්‍යතාවයක් ඉටු කරනු ලබන්නේ ද?
v. තරඟකරුවන් දෙදෙනෙකු විසින් දෛනිකව සපයන යෝගට් ප්‍රමාණය වෙන වෙනම ගණනය කර දක්වන්න.
vi. සුදෙස්ගේ ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු ද? හේතු දක්වන්න.
vii. සුදෙස්ගේ ව්‍යාපාරය ඇසුරින් අලෙවි මිශ්‍රයේ විචල්‍යයන් සඳහා (4Ps) උදාහරණ සපයන්න.
viii. රිදීගම කරඳගොල්ල ප්‍රදේශයේ යෝගට් පරිභෝජනය කරන පාරිභෝගික සංඛ්‍යාව ගණනය කර දක්වන්න.
ix. සුදෙස් විසින් දෛනිකව සැපයීමට අපේක්ෂිත යෝගට් ප්‍රමාණය ගණනය කරන්න.
x. සුදෙස්ගේ ව්‍යාපාරයේ මාසික ඉපැයුම ගණනය කර දක්වන්න.

(ලකුණු 02 × 10 = 20)

(02) i. ව්‍යවසායකයින් නිරන්තරයෙන් අවදානය යොමු කරන, අවදානම හා ප්‍රතිලාභ අතර පවතින සම්බන්ධතාවය සඳහන් කරන්න.

ii. ව්‍යාපාර ව්‍යවසායකයින් සඳහා උදාහරණ හතරක් ලියන්න.

iii. ව්‍යවසායකත්ව කාර්ය තුළින් අත් වන ප්‍රධාන ප්‍රතිලාභ දෙක සඳහන් කරන්න.

iv. ව්‍යවසායකයකු අයිතිකරුගේ භූමිකාවේ කටයුතු කිරීමේ දී ඉටු කරනු ලබන කාර්යයන් දෙකක් ලියන්න.

v. සෑම ව්‍යාපාරිකයෙක්ම ව්‍යවසායකයෙක් නොවේ. එසේම සෑම ව්‍යවසායකයෙක්ම ව්‍යාපාරිකයෙක් ද නොවේ. මේ අනුව ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර ඇති වෙනස්කම් දෙකක් ලියන්න.

(ලකුණු 02 × 05 = 10)

(03) i. ව්‍යවසායකත්ව කාර්යයේ නිරතවීමේ දී ව්‍යවසායකයකු විසින් වර්ධනය කරගත යුතු කුසලතා හතරක් ලියන්න.

ii. ආරම්භ කරන බොහෝමයක් සුළු පරිමාණ ව්‍යාපාර කෙටිකාලයකින් අසාර්ථක වේ. මෙසේ කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන කරුණු හතරක් ලියන්න.

iii. SCAMPER ආකෘතියේ සඳහන් නිෂ්පාදන නව්‍යකරණයට මග පෙන්වන "ආදේශ කිරීමක්" සඳහා උදාහරණ දෙකක් සපයන්න.

iv. ව්‍යවසායකයෙකුට ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීමෙන් අත්වන ප්‍රයෝජන දෙකක් ලියන්න.

v. ව්‍යවසායකයෙක් තුළ පවත්නා නිර්මාණශීලීත්වය සහ නවෝත්පාදනය අතර පවත්නා සම්බන්ධතාවය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 02 × 05 = 10)

(04) i. "පේටන්ට් බලපත්‍රයක්" පිරිනැමීම සඳහා නව සොයා ගැනීමක් ලෙස සලකන දෑ දෙකක් ලියන්න.

ii. සීඝ්‍ර වෙනස්වීම් සමඟ පුළුල් වන ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන නව ප්‍රවණතා හතරක් ලියන්න.

iii. ව්‍යවසායකයකුට ව්‍යාපාර අදහස් පහළ විය හැකි මූලාශ්‍ර හතරක් ලියන්න.

iv. නව ව්‍යවසායකයකුට ව්‍යාපාරය සඳහා අවශ්‍යකරන ප්‍රාග්ධනය සම්පාදනය කරගත හැකි මාර්ග හතරක් ලියන්න.

v. ව්‍යාපාරයක් පිහිටුවන ස්ථානය තීරණය කිරීමේ දී සලකා බලන සාධක හතරක් ලියන්න.

(ලකුණු 02 × 05 = 10)

(05) i. වෙළඳපළ විශ්ලේෂණයක දී අවදානය යොමු කළ යුතු කරුණු දෙකක් ලියන්න.

ii. ඇඟලුම් නිෂ්පාදන ව්‍යාපාරයක මුළු නිෂ්පාදන පිරිවැයෙහි අන්තර්ගත වන වෙනත් නිෂ්පාදන පිරිවැය සඳහා උදාහරණ හතරක් ලියන්න.

iii. කුමන ක්‍රමය ඔස්සේ ව්‍යවසායකයින් වෙළඳපලට පිවිසිය ද පවතින දැඩි තරගකාරිත්වයට සාර්ථකව මුහුණ දීමට නම් සාර්ථක පිවිසුම් උපාය මාර්ගයක් අනුගමනය කළ යුතුය. එසේ අනුගමනය කළ හැකි උපාය මාර්ග දෙකක් ලියන්න.

iv. ව්‍යවසායකයකුට ව්‍යාපාරයක් සඳහා ව්‍යාපාර සැළැස්මක් පිළියෙල කර ගැනීමෙන් අත්වන ප්‍රයෝජන හතරක් ලියන්න.

v. ව්‍යාපාර සංවිධානයක පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

(ලකුණු 02 × 05 = 10)

(06) i. හිමිකාරිත්වය අනුව පහත සඳහන් ව්‍යාපාර වර්ග කර දක්වන්න.

- හවුල් ව්‍යාපාර
- දෙපාර්තමේන්තු
- සංස්ථා
- සංස්ථාපිත සමාගම්

ii. කේවල ස්වාමි ව්‍යාපාර වල මූලිකව ම දැකිය හැකි ලක්ෂණ හතරක් ලියන්න.

iii. ව්‍යාපාරයකට සමාජයීය වගකීම් ඉටු කළ හැකි මට්ටම් දෙකක් ලියන්න.

iv. සීමා සහිත පෞද්ගලික සමාගමක දැකිය හැකි වාසි හතරක් ලියන්න.

v. ව්‍යවසායකයින් සඳහා මූල්‍යමය නොවන දිරිගැන්වීම් ලබා දෙන ආයතන හතරක් ලියන්න.

(ලකුණු 02 × 05 = 10)

(07) දසුන් මහතා විසින් ආරම්භ කර පවත්වාගෙන යාමට නියමිත ලිපි ද්‍රව්‍ය අලෙවිසැල සඳහා පිළියෙල කළ ව්‍යාපාර සැලැස්මෙන් 2020 වර්ෂය සඳහා උපුටා ගන්නා ලද තොරතුරු පහත දැක් වේ.

| | රු. |
|---|---|
| ★ දසුන් යෙදවීමට නියමිත මුදල | 300 000 |
| ★ බැංකු ණය (අපේක්ෂිත) | 200 000 |
| ★ ණය වාරික හා පොලිය ගෙවීම | 42 000 |
| ★ විදුලි බිල් ගෙවීම | 24 000 |
| ★ විකිණීමට ලිපිද්‍රව්‍ය මිලට ගැනීම | 150 000 |
| ★ විකිණීමට ලිපිද්‍රව්‍ය ණයට ගැනීම | 50 000 |
| ★ ණයගැතියන්ගෙන් ලැබීම් | 60 000 |
| ★ අපේක්ෂිත අත්පිට විකුණුම් | 250 000 |
| ★ අපේක්ෂිත ණයට විකුණුම් | 80 000 |
| ★ සේවක වැටුප් ගෙවීම් | 70 000 |
| ★ උපකරණ මිලට ගැනීම | 45 000 |
| ★ ණයහිමියන්ට ගෙවීම | 40 000 |

අවශ්‍ය වන්නේ,

i. 2020 වර්ෂය සඳහා දසුන්ගේ ව්‍යාපාරයේ ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීම. (ල. 06)

ii. දසුන්ගේ ව්‍යාපාරයේ මුළු මුදල් ගලා ඒම් සහ මුළු මුදල් ගලා යාම් වෙන වෙනම දැක්වීම. (ල. 02)

iii. ඉහත තොරතුරු අතරින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීම සඳහා <u>යොදා නොගන්නා</u> අයිතම දෙක සඳහන් කිරීම (ල. 02)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(3) | 3 -(4) | 4 -(3) | 5 -(4) | 6 -(2) | 7 -(2) | 8 -(3) | 9 -(1) | 10 -(2) |
| 11-(3) | 12 -(1) | 13 -(3) | 14 -(3) | 15 -(1) | 16 -(2) | 17 -(1) | 18 -(4) | 19 -(2) | 20 -(3) |
| 21-(1) | 22 -(3) | 23 -(4) | 24 -(2) | 25 -(3) | 26 -(4) | 27 -(1) | 28 -(2) | 29 -(3) | 30 -(2) |
| 31-(2) | 32 -(1) | 33 -(3) | 34 -(2) | 35 -(1) | 36 -(3) | 37 -(2) | 38 -(2) | 39 -(4) | 40 -(1) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. • පවතින වෙළඳපළකට නව භාණ්ඩයක් ඉදිරිපත් කිරීම මගින් (ල. 02)

ii. • ද්විතියික අංශය (ල. 02)

iii. • සම්පත් පැවතීම
• තරඟකාරිත්වයට මුහුණදිය හැකි වීම
• ඉල්ලුමක් පැවතීම
• නීතිරීති වලට අනුකූල වීම
• ආකර්ශණීය ඉපයුමක් පැවතීම (කරුණු එකකට ලකුණු 01 බැගින් = ල. 02)

iv. • ආහාර අවශ්‍යතාවය (ල. 02)

v. • ප්‍රනීත $2400 \times \frac{50}{100} = 1200$

• රසික $2400 \times \frac{20}{100} = 480$

vi. ලියාපදිංචි කළ යුතුය. (ල. 01)
• සුදෙස් ගේ නමින් හැර වෙනත් (ව්‍යාජ) නමකින් පවත්වාගෙන යා යුතු නිසා (ල. 01)

vii.
| | | |
|---|---|---|
| නිෂ්පාදිතය | :- | ඖෂධීය යෝගට් |
| මිල | :- | රු. 30 යි |
| ස්ථානය | :- | සිල්ලර වෙළඳ සැල් |
| ප්‍රවර්ධනය | :- | පෝස්ටර් |

viii. $6\,000 \times \frac{40}{100} = 2400$　　ix. $2\,400 \times \frac{10}{100} = 240$

(ල. 02)

x. $240 \times 30$ = රු. 7 200

(02) i. අවදානම ඉහළ නම් ප්‍රතිලාභ ද ඉහළ වන අතර අවදානම පහළ නම් ප්‍රතිලාභ ද පහළ වේ. (ල. 02)

ii. ලාභ උපයන ඕනෑම ව්‍යාපාර වර්ග හතරක් සඳහා ලකුණු 02 යි.

iii. ව්‍යාවසායකයාට හිමිවන ප්‍රතිලාභ හා දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ
(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකට ල. 02)

iv. • අවශ්‍ය සම්පත් සැපයීම
• අවදානම් දුරීම
• වැදගත් තීරණ ගැනීම
(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකට ල. 02)

v. ව්‍යාපාරිකයා :- • තරඟයට මුහුණ දීමට කැමැත්තක් නොදක්වයි, • ගතානුගතික ක්‍රමයට ගැටලු විසඳයි, • ආසන්න ඉලක්ක ඇති කර ගනියි, • තිබෙන තත්වයෙන්ම ව්‍යාපාරය පවත්වා ගෙන යයි, • සම්පත් වලින් නිසි ප්‍රයෝජන නොගනී, • අවදානම් භාර ගැනීමට කැමැත්තක් නොදක්වයි, • සාම්ප්‍රදායික ක්‍රමයට ව්‍යාපාරය පවත්වාගෙන යයි.

ව්‍යවසායකයා :- ⋆ තරඟය කැමැත්තෙන් සොයා යයි, ⋆ නිර්මාණශීලීව ගැටලු විසඳයි, ⋆ දගුකාලීන ඉලක්ක පිහිටුවා ගනියි, ⋆ දිනෙන් දින පුළුල් තරඟයකින් ව්‍යාපාරය පවත්වාගෙන යයි, ⋆ උපරිම ලෙස සම්පත් ප්‍රයෝජනයට ගනියි, ⋆ මැන තක්සේරුකර අවදානම් භාර ගනියි, ⋆ පරිසර වෙනස්වීම් වලට අනුගත වෙමින් නිර්මාණශීලීව ව්‍යාපාර පවත්වාගෙන යයි.

(03) i.
- තාක්ෂණික කුසලතා
- සංකල්පනාත්මක කුසලතා
- මානව කුසලතා
- ආදර්ශවත්ව කටයුතු කිරීමේ කුසලතා
- සංනිවේදන කුසලතා
- කණ්ඩායම් සමග කටයුතු කිරීමේ කුසලතා

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකට ල. 02)

ii.
- මුදල් කටයුතු පාලනය දුර්වල විම.
- තරඟකාරිත්වයට මුහුණ දීමට අපහසු වීම
- ව්‍යාපාර කටයුතු සැලසුමකින් තොරව කිරීම
- දුර්වල මානව සම්බන්ධතා
- ව්‍යාපාර කටයුතු පිළිබඳ පළපුරුද්ද ප්‍රමාණවත් නොවීම
- සම්පත් නිසි ලෙස පාලනය නොකිරීම
- ව්‍යවසායකයෙකු ලෙස කටයුතු නොකිරීම (එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකට ල. 02)

iii. ගැලපෙන පිළිතුරු 02කට ල. 02

iv.
- ව්‍යාපාරය සතු ශක්තීන් හඳුනාගැනීමට හැකි වීම
- ව්‍යාපාරයේ ඇති දුර්වලතා හඳුනාගත හැකි වීම
- ව්‍යාපාරයට මුහුණ දීමට සිදු වන තර්ජන හඳුනාගත හැකි වීම
- ව්‍යාපාරයට උදාවන අවස්ථා හඳුනාගත හැකි වීම
- පරිසරයක වෙනස්වීම් වලට අනුව සැලසුම් සැකසිය හැකි වීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකට ල. 02)

v. පුද්ගලයකු තුළ ඇති හැකියාව නිර්මාණශිලීත්වය වන අතර එම හැකියාව නිෂ්පාදිතයක් බවට පත් කිරීම නවෝත්පාදනයයි.

04. i.
- නව නිපැයුමක්
- නව යන්ත්‍රයක්
- නව ක්‍රියාවලියක්
- පවත්නා සොයා ගැනීමක වැඩි දියුණු කිරීමක් (එක් කරුණකට ල. 01 බැගින් කරුණු 02 = ල. 02)

ii.
- ★ පරිසර හිතකාමී බලශක්ති ජනනය
- ★ සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනය
- ★ නව තාක්ෂණය භාවිතය
- ★ ගෝලීයකරණය

(ගැලපෙන එක් කරුණකට ල. 1/2 බැගින් කරුණු 04 = ල. 02)

iii.
- විනෝදාංශ හා ලැදියා තුළින්
- පුද්ගල දක්ෂතා හා පළපුරුද්ද මගින්
- වෙළඳපොළ සමීක්ෂණ තුළින්
- ප්‍රදර්ශන හා අත්දැකීම් මගින්

(ගැලපෙන එක් කරුණකට ල. 1/2 බැගින් කරුණු 04 = ල. 02)

iv.
- තමා ඉතිරිකර ගත් මුදල්
- ස්වකීය වත්කම් යෙදවීම මගින්
- හිතමිතුරන්ගෙන් ඉල්ලා ගැනීම
- බැංකු ණය ලබා ගැනීම
- කල්බදු පහසුකම් මගින්
- ගණුදෙනුකරුවන්ගෙන් අත්තිකාරම් ලබා ගැනීම මගිනි

(එක් කරුණකට ල. 1/2 බැගින් කරුණු 04 = ල. 02)

v.
- අමුද්‍රව්‍ය ලබා ගැනීමේ පහසුව
- ශ්‍රමය ලබා ගැනීමේ පහසුව
- භූමියේ පිරිවැය
- යටිතල පහසුකම් ලබා ගැනීමේ පහසුව
- ශ්‍රමය ලබා ගැනීමේ පහසුව
- පාරිභෝගිකයින්ට සැපයිය හැකි පහසුකම්

(එක් කරුණකට ල. 1/2 බැගින් කරුණු 04 = ල. 02)

(05) i.
- ★ තම භාණ්ඩය හෝ සේවාව සඳහා ඇති ඉල්ලුම
- ★ ඉලක්ක පාරිභෝගිකයා
- ★ තරඟකරුවන්

(එක් කරුණකට ල. 01 බැගින් කරුණු 02 = ල. 02)

ii.
- නිෂ්පාදන ස්ථාවර වත්කම් ක්ෂය
- කර්මාන්තශාලා මුරකරුගේ වැටුප
- කර්මාන්තශාලා රක්ෂණ ගාස්තු
- නිෂ්පාදනාගාරයේ විදුලි වියදම්

(ගැලපෙන එක් කරුණකට ල. 1/2 බැගින් කරුණු 04 = ල. 02)

iii.
- නිෂ්පාදන ප්‍රභේදනය
- වෙළඳපල හිඩැස / අවකාශය
- නවෝත්පාදනය
- සුවිශේෂ නව භාණ්ඩයක් හෝ සේවාවක් වීම

(එක් කරුණකට ල. 01 බැගින් කරුණු 02 = ල. 02)

iv. • අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීමට පහසු වීම • ව්‍යාපාරයේ අනාගත දිශාව පෙන්වා දීමට
• ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් හඳුනා ගැනීමට • වෙළඳපල පිළිබඳ පොදු තක්සේරුවක් ලබා ගැනීමට
• ව්‍යාපාරය සඳහා මග පෙන්වීමට • ව්‍යාපාර පරිසරය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට
(එක් කරුණකට ල. 1/2 බැගින් කරුණු 04 = ල. 02)

v. • පොදු අරමුණක් පැවතීම • සීමිත සම්පත් භාවිතය
• සාමූහික සම්බන්ධතාවක් පැවතීම • ආර්ථික කටයුත්තක නියැලීම
• පුද්ගල කණ්ඩායමක් ඒකරාශි වී සිටීම
(එක් කරුණකට ල. 1/2 බැගින් කරුණු 04 = ල. 02)

(06) i. පෞද්ගලික අංශය රාජ්‍ය අංශය (පොදු අංශය)
• හවුල් ව්‍යාපාර • දෙපාර්තමේන්තු
• සංස්ථාපිත සමාගම් • සංස්ථා
(එක් කරුණකට ල. 1/2 බැගින් කරුණු 04 = ල. 02)

ii. • ප්‍රාග්ධනය අයිතිකරු විසින් යෙදවීම • නෛතික පුද්ගලභාවයක් නොමැතිවීම
• ලියාපදිංචිය අනිවාර්යය නොවීම • අයිතිකරුගේ වගකීම අසීමිත වීම
• අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම • ලාභ පාඩු තනිවම භුක්ති විඳීම
• හිමිකාරත්වය තනි පුද්ගලයකු සතු වීම (එක් කරුණකට ල. 1/2 බැගින් කරුණු 04 = ල. 02)

iii. • ආර්ථික වගකීම • නීතිමය වගකීම • සදාචාරාත්මක වගකීම්
• පරාර්ථකාමී වගකීම (එක් කරුණකට ල. 01 බැගින් කරුණු 02 = ල. 02)

iv. • වගකීම සීමිත වීම • අඛණ්ඩ පැවැත්මක් තිබීම
• නෛතික පුද්ගලභාවයක් හිමිවීම • පවුලේ අය හිතමිතුරන් සම්බන්ධ කර ගෙන ඇරඹිය හැකි වීම
• ලාභය සුළු පිරිසක් අතර බෙදීයාම • පාලනය පහසු වීම
• එක් පුද්ගලයකුට වුව ද ආරම්භ කළ හැකි වීම

v. • කාර්මික සංවර්ධන මණ්ඩලය • කාර්මික තාක්ෂණ ආයතනය
• ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය • ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
(එක් කරුණකට ල. 1/2 බැගින් කරුණු 04 = ල. 02)

(07) i. "දසුන්ගේ ව්‍යාපාරය"
2020 වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය 1/2

| | | | |
|---|---|---|---|
| **අපේක්ෂිත මුදල් ගලා ඒම** | | | |
| • අයිතිකරු යෙදවුම් | 300 000 | 1/2 | |
| • බැංකු ණය | 200 000 | 1/2 | (2) |
| • අත්පිට විකුණුම් | 250 000 | 1/2 | |
| • ණයගැති ලැබීම් | 60 000 | 1/2 | 810 000 |
| **අපේක්ෂිත මුදල් ගලා යාම්** | | | |
| • ණයවාරික හා පොලිය ගෙවීම | 42 000 | 1/2 | |
| • විදුලි බිල් ගෙවීම් | 24 000 | 1/2 | |
| • විකිණීමට ලිපිද්‍රව්‍ය මිලට ගැනීම | 150 000 | 1/2 | (3) |
| • සේවක වැටුප් ගෙවීම | 70 000 | 1/2 | |
| • උපකරණ ගැනීම | 45 000 | 1/2 | |
| • ණයහිමියන්ට ගෙවීම | 40 000 | 1/2 | (371 000) |
| මුදල් ශේෂය | | | 439 000 1/2 |

ii. මුළු මුදල් ගලා ඒම රු. 810 000 මුළු මුදල් ගලා යාම් රු. 371 000
(නිවැරදි පිළිතුරු දෙකට ලකුණු 02 යි)

iii. • විකිණීමට ලිපි ද්‍රව්‍ය ණයට ගැනීම් (එක් කරුණකට ල.01 බැගින් කරුණු 02 = ල. 02)
• අපේක්ෂිත ණයට විකුණුම්